



# ජාතික ව්‍යාපාර හා ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ









සැකසුම:- කෞශල්‍යා ගම්ලත්
ර/ විද්‍යාරාජ විද්‍යාලය
බටුගෙදර

- ක්‍රි.ව.1815 බ්‍රිතාන්‍යයන් විසින් උඩරට අල්ලා ගනු ලැබීමත් සමග ලංකාවේ පැවති රාජාණ්ඩු ක්‍රමය අහෝසි වූ අතර එතැන් පටන් 1945 නිදහස ලැබෙන තුරු වසර 133 ක් ඔවුහු ලංකාව පාලනය කළහ.
- 1818, 1848 නිදහස් අරගල අසාර්ථක වීමෙන් පසු ලාංකිකයන් බ්‍රිතාන්‍යයන්ට විරුද්ධව යුධමය අරගල අතහැර දැමූ අතර තම දෛනික අවශ්‍යතා කෙරෙහි පමණක් අවධානය යොමු කිරීම නිසා බ්‍රිතාන්‍ය ආර්ථික ඉලක්ක වලට ද ඔවුන්ගෙන් සහයක් නොවීය.
- මේ නිසා සහ තවත් කරුණු කිහිපයක් නිසා බ්‍රිතාන්‍ය රජයට අයවැය හිගයකට මුහුණ දීමට සිදුවූ අතර එය විසදාගැනීමට ඔවුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ කෙරෙහි යොමු විය.
- මෙකල මෙරට බිහිවූ දේශීය උගත් මධ්‍යම පන්තිය දේශපාලනයට පිවිසෙමින් මෙම ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ වලින් සෑහීමකට පත් නොවී නොකඩවා උද්ඝෝෂණ ගෙනගියහ.
- මෙම ජාතික ව්‍යාපාරයේ ප්‍රතිඵලයක් ලෙස වරින් වර ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ලබා දීමට ඉංග්‍රීසින්ට සිදුවූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස 1948 නිදහස දිනා ගැනීම ලාංකිකයන්ට හැකි විය.

# ජාතික ව්‍යාපාරය

- *විදේශ ආධිපත්‍යයෙන් මිදීම සඳහා කිසියම් රටක සියලු ජන කොටස් එක්ව එකම අරමුණකින් සංවිධානය වී ගෙනයනු ලබන අරගල* ජාතික ව්‍යාපාර ලෙස හඳුන්වයි.

- ලංකාවේ 19 වැනි සියවස අග හා 20 වන සියවස මුල එවැනි ජාතික ව්‍යාපාරයක් බිහිවේ. ඒ බ්‍රිතාන්‍ය රජයට විරුද්ධව ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සඳහා ඇති වූ උද්ඝෝෂණ ව්‍යාපාරයයි.

- ඒ තුළ
  - *ලංකා ප්‍රතිසංස්කරණ සංගමය*
  - *යාපනය සංගමය*
  - *හලාවත සංගමය*
  - *අමද්‍යප ව්‍යාපාරය*
  - *ලංකා කෘෂිකර්ම සංගමය*
  - *ලංකා ජාතික සංගමය*

# ලංකාවේ බිහිවූ ජාතික ව්‍යාපාරයේ අරමුණු


- ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ලබා ගැනීමට කටයුතු කිරීම
- ජාතික ඒකාග්‍රතාවය ගොඩනැගීම
- උද්ඝෝෂණ ව්‍යාපාර මෙහෙයවීම
- ආගමික හා සංස්කෘතික පුනර්ජීවනය ඇතිකිරිම
- ස්වදේශිකයන්ට වගකීම් සහිත ආණ්ඩුවක් ලබා ගැනීම
- සාමකාමී උද්ඝෝෂණ වලට මුල්තැන දීම
- කෙටි කාලයක් තුළ විදේශීය ආධිපත්‍යයෙන් රට මුදා ගැනීම

# ලංකා ජාතික ව්‍යාපාරය සහ මධ්‍යම පන්තිය


- ✓ කෝල්බෲක් ප්‍රතිසංස්කරණ වලින් පසු එලඹෙන දශක කිහිපය තුළ වතු වගාවට අවශ්‍ය සේවා සැපයීමෙන්, අරක්කු රේන්ද මිලට ගැනීමෙන්, පොල් වතු පවත්වාගෙන යාම ආදියෙන්  ධනවත් වූ නව සමාජ පන්තියක් මෙරට දේශීය ජනතාව අතුරින් බිහිවන අතර ඔවුන් මධ්‍යම පංතිය නම් විය.
- ✓ ඔවුන් තම දරුවන්ට ඉංග්‍රීසි අධ්‍යාපනය හා විදේශ අධ්‍යාපනය ලබා දෙන අතර එමගින් උගත් මධ්‍යම පන්තියක් බිහිවිය.
- ✓ පැරණි ප්‍රභූ පන්තිය අභිබවා නැගී සිටි මොවුන්ට ධනය උගත්කම තිබුනත් දේශපාලන බලය නොවූයෙන් එය ලබා ගැනීමට ඔවුන් ආණ්ඩුවට එරෙහිව උද්ඝෝෂණ ව්‍යාපාර වල නිරත වෙයි.
- ✓ ලංකා ජාතික සංගමය ප්‍රධානත්වය ගත් ලංකාවේ ජාතික ව්‍යාපාරයේ නායකත්වය ගන්නේ මෙම උගත් මධ්‍යම පන්තියයි.

# ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ වල වැදගත් අවස්ථා

*බ්‍රිතාන්‍ය යුගයේ ලංකාවේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ වල වැදගත් අවස්ථා 5 ක් හමුවේ.*




# කෝල්බෲක් ප්‍රතිසංස්කරණය 1833





- එතෙක් ක්‍රියාත්මක වූ උපදේශක සභාව අහෝසි කොට ව්‍යවස්ථාදායක සභාවක් හා විධායක සභාවක් හඳුන්වා දෙයි.
- ආණ්ඩුකාරවරයාගේ අධික බලතල සීමා කිරීම මෙහි අරමුණ විය.
- නිල නොලත් නියෝජනය අවම වීම නිසා කරනලද උද්ඝෝෂණ වල ප්‍රතිඵලයක් ලෙස 1889 දී එහි සංඛ්‍යාව 8ක් බවට පත් කරන ලදි.
- ආණ්ඩුකාරවරයා මෙහි සභාපති බැවින් සහ සියලුම නිලධාරින් ඔහු විසින් පත්කරන බැවින් බලාපොරිත්තු වූ දේ ඉටු නොවිනි

මෙම ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය 1910 වන තුරුම ක්‍රියාත්මක විය. එහි තිබූ දුර්වලතා නිසාත්, ඒවාට එරෙහිව පෙත්සම් හා ඉල්ලීම් ඉදිරිපත් වූ නිසාත්, දීර්ඝ කාලයක් වෙනස් නොකල යල් පැන ගිය ප්‍රතිසංස්කරණයක් නිසාත් 1910 දී මැකලම් ආණ්ඩුකාරවරයාට නව ප්‍රතිසංස්කරණයක් හඳුන්වා දීමට සිදුවිය.




# කෲව් - මැකලම් ප්‍රතිසංස්කරණය 1910





- ව්‍යවස්ථාදායක සභාවේ සංයුතිය 21 දක්වා වැඩිවිය.
- ප්‍රථම වරට ව්‍යවස්ථාදායක මණ්ඩලයේ සාමාජිකයන් 4 දෙනෙකු සීමිත ඡන්ද බලයෙන් තෝරා ගැනුණි. ඉන් එක් අයෙකු උගත් ලාංකික නියෝජිතයෙකු විය ( පොන්නම්බලම් රාමනාදන් මහතා)
- ජනවාර්ගික නියෝජනය, ආණ්ඩුකාරවරයා ගේ අධික බලතල හා නිල නොලත් පිරිස අධික වීම යන දුර්වලතා මෙහි විය.

# මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය 1920




- ප්‍රථම වතාවට නිල නොලත් නියෝජිත පිරිස වැඩි වීම
- පළාත්බද ඡන්ද කොට්ඨාස ක්‍රමය හඳුන්වා දීම
- ව්‍යවස්ථාදායක මණ්ඩලයේ බලතල වැඩිවීම
- නමුත් තවමත් ආණ්ඩුකාරවරයා සතුව පනත් හා මන්ත්‍රී වරු පත්කිරීම සම්බන්ධව අධික බලතල තිබීම හා
- ඡන්දයෙන් පත්වන්නේ 16 දෙනෙකු පමණක් බැවින් නිල ලත් 14 දෙනා හා නාමකරණයෙන් පත් වන 7 දෙනා ආණ්ඩුකාරුට පක්ෂපාතී වීමට ඉඩකඩ වැඩි වීම යන දුර්වලතා එහි විය.

# මැනිං ඩෙවොන්ෂෙයර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය 1924




- ✓ මැනිං ප්‍රතිසංස්කරණයේ තිබූ දුර්වලතා නිසා ලංකා ජාතික සංගමයේ ඉල්ලීම මත මෙම ප්‍රතිසංස්කරණය හදුන්වා දෙන ලදි.
- ✓ මෙහි ව්‍යවස්ථාදායකයේ සාමාජික සංඛ්‍යාව 49 දක්වා ඉහළ යයි.
- ✓ මෙහි විශේෂත්වය වන්නේ සාමාජිකයින් අඩකට වඩා වැඩි ප්‍රමාණයක් මහජන සීමිත ජන්දයෙන් තෝරා ගැනීමයි.
- ✓ ව්‍යවස්ථාදායකයේ මුලසුන තවමත් ආණ්ඩුකාරු සතු විය
- ✓ සීමිත ජන්ද බලය වෙනසක් නොවීය.
- ✓ ජනවාර්ගික නියෝජන ක්‍රමය තවදුරටත් පැවතුණි .
- ✓ වගකීම ආණ්ඩුකරුටත් ජනතා බලය සාමාජිකයින්ටත් ලැබුණු මෙම ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක කළ නොහැක්කක් බව පෙන්වා දීමෙන් වෙනත් ප්‍රතිසංස්කරණයකට යොමු වෙයි.


# ඩොනමෝර් ප්‍රතිසංස්කරණය 1931

- නිදහස කරා ක්‍රමයෙන් ගමන් කරන ශ්‍රී ලාංකිකයන්ට ඩොනමෝර් ප්‍රතිසංස්කරණය වැදගත් සංධිස්ථානයකි.
- මැනිං ක්‍රමයේ පැවති වගකීම හා බලය දෙපිරිසක් අත බෙදී යාම දුර්වලතාවයක් ලෙස පෙන්වාදුන් දේශීය නායකයින්ගේ උද්ඝෝෂණ වලට පිළිතුරක් ලෙස ලංකාවට සුදුසු ආණ්ඩුක්‍රමයක් යෝජනා කිරීමට පැමිනි ඩොනමෝර් කොමිසම මම ප්‍රතිසංස්කරණය ඉදිරිපත්කරයි.

- මෙහි ප්‍රධාන ලක්ෂණ
  - *රාජ්‍ය මන්ත්‍රණ සභාව*
  - *විධායක කාරක සභා ක්‍රමය*
  - *ආණ්ඩුකාරවරයා ගේ බලතල සීමා කිරීම*
  - *රාජ්‍ය නිලධාරින් තිදෙනා*
  - *ජනවාර්ගික නියෝජනය අහෝසි කිරීම*
  - *සර්වජන ඡන්ද බලය*
  - *පලාත් බද නියෝජනය පුළුල් කිරීම*

# ඩොනමෝර් ප්‍රතිසංස්කරණය 1931

## *රාජ්‍ය මන්ත්‍රණ සභාව හා රාජ්‍ය නිළධාරීන් තිදෙනා*




- රාජ්‍ය මන්ත්‍රණ සභාව - 61
- ව්‍යවස්ථාදායක හා විධායක සභා දෙක වෙනුවට රාජ්‍ය මන්ත්‍රණ සභාව හඳුන්වා දීම
- මූලසුන කතානායක
- බලතල - නීති පැනවීම, වාර්ෂික අය වැය ඉදිරිපත් කිරීම, විධායකයට යෝජනා ඉදිරිපත් කිරීම, විධායක කාරක සභා පරීක්ෂාව
- රාජ්‍ය නිළධාරීන් ආණ්ඩුකාරවරයා පත් කරන අතර බලතල රාශියක් ඔහු සතුවේ.

# ඩොනමෝර් ප්‍රතිසංස්කරණය 1931

- ආණ්ඩුකාරවරයා
  - *රජු හෝ රැජිනගේ නියෝජිතයා වීම*
  - *බලතල : ආරක්ෂක කටයුතු, විදේශ කරයුතු, ආගමන කටයුතු, නැව ගමනාගමන කටයුතු, මුදල් හා සේවා, වෙළෙඳ ගිවිසුම්, අධිකරණ කටයුතු*
  - *මේ කටයුතු වලදී ඔහු යටත් විජිත භාර ලේකම් වරයාට බැඳී සිටී.*
- විධායක කාරක සභා ක්‍රමය
  - *රාජ්‍ය නිලධාරින් හැර ඉතිරි 57 කාරක සභා 7 කට බෙදීම*
  - *වැඩි දෙනාගේ කැමැත්තෙන් කාරක සභාවේ නායකයා තෝරා ගනී.*
  - *රාජ්‍ය නිලධාරීන් තිදෙනා හා කාරක සභා නායකයින් අමාත්‍ය මණ්ඩලය වේ.*

# ඩොනමෝර් ප්‍රතිසංස්කරණය 1931

- ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ යහපත් ලක්ෂණ -
  - සර්වජන ජන්ද බලය - අවුරුදු 21ට වැඩි සියලු දෙනාට ජන්ද බලය හිමි වීම
  - වාර්ගික නියෝජනය ඉවත් කිරීම
  - ජන්ද බලය හිමි ප්‍රථම බ්‍රිතාන්‍ය යටත් විජිතය වීම
  - ජනතාවට දේශපාලනයට සහභාගී වීමට අවස්ථාව ලැබීම
  - දේශපාලන පක්ෂ බිහිවීමට පදනම වැටීම
  - විධායක කාරක සභා මගින් දේශීය නායකයින් පෙරමුණට ඒම (ඩී.එස්. සේනානායක, සී ඩබ්. ඩබ්. කන්නංගර)
  - දේශීය නියෝජනය ඉහළ යාම
- ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ දූර්වලතා -
  - ක්‍රියාත්මක වීමේදී ප්‍රායෝගික දූර්වලතා මතු වීම
  - ජනතා බලය දේශීයන්ට හිමිවුවත් ආණ්ඩුකාරවරයා, රාජ්‍ය නිලධාරින් සතුව බලතල හා වැදගත් අමාත්‍යාංශ පැවතීම
  - දේශීය නායකයින් තුළ දේශපාලන අත්දැකීම් අඩු වීම

# සෝල්බරි ආණ්ඩුක්‍රමය 1942




සොල්බරි සාමිවරයා බණ්ඩාරනායක හා ඩඩ්ලි සමග



- ඩොනමෝර් ප්‍රතිසංස්කරණයේ තිබූ දුර්වලතා හුවා දක්වමින් පූර්ණ වගකීමක් සහිත ආණ්ඩුක්‍රමයක් ඉල්ලා දේශීය නායකයින් දිගින් දිගටම කරන ලද උද්ඝෝෂණ හා ඉල්ලීම් නිසා 1944 දී සෝල්බරි කොමිසම නව ව්‍යවස්ථාවක් සකස් කිරීමට ලංකාවට පැමිණෙයි.
- ලංකාවේ තත්වය අධ්‍යනය කළ කොමිසම ඒ වන විට පවතින අමාත්‍ය මණ්ඩලය විසින් සකස් කර තිබූ ව්‍යවස්ථා කෙටුම්පත පදනම් කරගෙන නව ව්‍යවස්ථාවක් සම්පාදනය කරන ලවි.
- මේ පිළිබද සාකච්ඡා කිරීමට එංගලන්තයට කැඳවූ ඩී.එස්.සේනානායක මහතා කරුණු සහිතව පූර්ණ ස්වතන්ත්‍ර ආණ්ඩුවක් ලංකාවට අවශ්‍ය බව තරයේ කියා සිටි අතර ඒ අනුව 1945 ප්‍රසිද්ධියට පත් කළ සෝල්බරි වාර්ථාවට අනුව නව ආණ්ඩුක්‍රමයක් ලංකාවට හිමි විය.

# සෝල්බරි ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ

- ආණ්ඩුකාරවරයා වෙනුවට අග්‍රාණ්ඩුකාරවරයෙකු පත් කිරීම
- එංගලන්තය නියෝජනය කළ ඔහු නාම මාත්‍රික විධායක වීම
- ද්වි මණ්ඩල පාර්ලිමේන්තුව
- සුළු ජාතීන්ට රැකවරණය ලැබීම
- රාජ්‍ය සේවා කොමිසම හා අධිකරණ සේවා කොමිසම පිහිටුවීම




- සෝල්බරි ඇතැම් විධි විධාන වලට අනුව ලංකා පාර්ලිමේන්තුවට පරමාධිපත්‍යයක් හිමි නොවුණි.
- එබැවින් ලැබූ නිදහස අර්ධ නිදහසක් ලෙස හැඳින්වේ.(ඩොමීනියන් තත්වයක්)